සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	6 ශ්‍රේණිය	නාට්‍ය හා රංග කලාව I -II	කාලය / நேரம் / Time	පැය 02යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

I පත්‍රය

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට පහත සපයා ඇති A, B, C, D යන කොටස් ඇසුරු කරගෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

A. එළුවන් කන්නයි මං ආවේ
එළු බෙටි කාපන් තුන්දීරේ
සාවුන් කන්නයි මං ආවේ
සාබෙටි කාපන් තුන්දීරේ

B. ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි

C. කැත්තක් අරගෙන වත්තට යන කොට
පෙත්තෙක් ඉදගෙන කජු කනවා

D. ඇටිකිති වුස්
කකුළු වරස්
හාවා කළ එකෙල මෙකෙල

1. රබන් පදයක් වන්නේ,
(1) A (2) C (3) B (4) D

2. ජන ක්‍රීඩාවක් වන්නේ,
(1) B (2) D (3) A (4) C

3. ජන කතාවක එන කවියක් වන්නේ,
(1) D (2) A (3) B (4) C

4. ජනප්‍රිය වේදිකා නාට්‍ය ගීතයක් වන්නේ,
(1) D (2) C (3) A (4) B

5. සිංහල අලුත් අවුරුදු උත්සවවල දැකිය හැකි අංග දෙකකට අයත් කවි වන්නේ,
(1) A, C (2) C, B (3) B, D (4) A, D

Past Papers Wiki

- අංක 6 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

6. රංග අභ්‍යාසවල යෙදීමෙන් නලුවාට හානියක් සිදු වේ. ( )
7. "අබරං සිල් ගත්තා වගේ " යනු ජන කතාවකි. ( )
8. "තැන තැන රවුමට ඉදගෙන" ගීතය ඇසුරු කරගෙන ඇත්තේ ජන ක්‍රීඩාවකි. ( )
9. ඇලඩින්ගේ පුදුම පහන කතාවේ අධිමානුෂ චරිත දැකිය හැකිය. ( )
10. වේදිකා නාට්‍ය යනු සජීවී කලාවක් නොවේ. ( )

- අංක 11 – 15 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් නිවැරදි වචනය තෝරා හිස්තැන් පුරවන්න.

(අනුකරණය, ක්ෂණික නිරූපණ, නාට්‍යෝපකරණ, පරිකල්පනය, රංගාභරණ)

11. රංගනයේ දී යොදා ගන්නා උපකරණ ..... වේ.
12. යමෙකු කරන දෙයක් එලෙසින්ම කිරීම ..... යි.
13. ..... යනු පෙර සූදානමකින් තොරව සිදු කරන නිරූපණයන්ය.
14. රංගනයේ දී නළු නිළියන්ට හොඳ ..... හැකියාවක් තිබිය යුතු ය.
15. නළු නිළියන් රංගනයේ දී පළඳින මාල, වළලු ..... නම් වේ.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.

16. දෙමාපිය වැඳ පුදනු යහපත්	නාට්‍ය ගීත
17. ආලේ බැන්ද මාගේ රම්‍යවන්	ප්‍රේක්ෂකයා
18. ගුවන් විදුලි නාට්‍ය රස විඳින්නා	ළමා ගීත
19. ආදරේ ඇයි පොඩි හඳ මාමේ	සිරිත්මල්දම
20. වේදිකා නාට්‍ය නරඹන්නා	ශ්‍රාවකයා

(ලකුණු 2x20=40)

Past Papers Wiki

II පත්‍රය

- පළමු ප්‍රශ්නය සමඟ තවත් ප්‍රශ්න දෙකක් තෝරාගෙන සියලු ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

---

1) කුකුල් හාමි :- කවුද කැවුම් ටික උයලා ගත්තේ
මී හාමිලා හතර දෙනා :- කුකුල් හාමිමයි උයලා ගත්තේ (පසු බසිමින්)
කුකුල් හාමි :- කවුද කැවුම් ටික කන්නට ඕනෑ
මී හාමිලා හතර දෙනා :- කුකුල් හාමිමයි කන්නට ඕනෑ (පරාජිතව)

i. ඉහත දෙබස අයත් නාට්‍යයේ නම ලියන්න.
ii. මෙම නාට්‍ය නිර්මාණය කළේ කවුරුන්ද?
iii. මෙහි එන රංග විධානයක් ලියන්න.
iv. මෙහි දී කුකුල්හාමි විසින් මී හාමිලාට කැවුම් ලබා දුන්නේද?
v. අවසානයේ කුකුල්හාමි මී හාමිලාට ලබාදෙන උපදෙස කුමක්ද? (ලකුණු 04 x 05 = 20)

2) i. අභිනය යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 06)
ii. අභිනය සතර නම් කරන්න. (ලකුණු 06)
iii. ඉන් එක් අභිනයක් විස්තර කොට ඒ සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 08)

3) i. ජන කතා යනු මොනවාදැයි හඳුන්වන්න. (ලකුණු 06)
ii. ජන කතා තුනක් නම් කරන්න. (ලකුණු 06)
iii. ඉන් එක් ජන කතාවක් කෙටියෙන් ලියන්න. (ලකුණු 08)

4) i. ස්වාභාවික පරිසරයේ දැකිය හැකි ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 06)
ii. ඉන් එක් ක්‍රියාකාරකමකට උචිත ගීතයක් හෝ කවියක් නිරිමාණය කරන්න. (ලකුණු 06)
iii. ඊට උචිත චිත්‍රයක් අඳින්න. (ලකුණු 08)

5) පහත උචිත යුගලවලින් එකක් තෝරාගෙන කෙටි නාට්‍ය දෙබසක් ලියන්න.

i. කුඹියා සහ වැහිවළාකුල
ii. සිංහයා සහ මුව පැංචා
iii. ළමයා සහ සමනළයා (ලකුණු 20)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank